**මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගම - 2021**

---

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 ව්‍යාවනය කළ මතය

මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2 ව්‍යාවනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාවනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ වියාවනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වත්කම් යටතේ දැක්වෙන රු.12,430,943 ක් වූ තොග, ධාරණ අගය රු.260,539 ක් වූ ස්ථාවර වත්කම් සහ අත ඉතිරි මුදල් රු.173,727 ක් භෞතිකව නොපැවතුණි. රු.12,865,209 ක් වූ මෙම පාඩු සඳහා ප්‍රතිපාදනයන් ද මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබීම හේතුවෙන් වාර්ෂික/ සමුච්චිත පාඩුව එම ප්‍රමාණයෙන් වැඩි විය යුතු බව නිරීක්ෂණය විය. මූල්‍ය ප්‍රකාශනවල පවත්නා වත්කම් භෞතිකව නොපැවතීමට හේතු සහ ඊට වගකිව යුතු පුද්ගලයින් නිශ්චය කිරීමට පරීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර වත්කම්වල ආරක්ෂාව සම්බන්ධයෙන් ද කළමනාකරණය විසින් ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. | එකඟ වේ. ඉදිරියේදී පවතින අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමකදී මේ පිළිබඳ ප්‍රතිපාදනයන් වෙන් කිරීම සඳහා අනුමැතිය ලබා ගනු ඇත. | වගකිව යුතු නිලධාරීන් විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. |

### 1.5.2 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 දෙසැම්බර් 31 දිනට සමාගමේ සමුච්චිත අලාභය රු.3,688,356,619 ක් වූ අතර එදිනට සමාගමේ ශුද්ධ වත්කම් රු.3,613,356,619 ක සෘණ අගයක් නිරූපණය විය. සමාගමේ මෙහෙයුම් කටයුතු 2017 නොවැම්බර් 13 දින සිට නතර කර තිබුණු අතර 2018 පෙබරවාරි 15 දින සමාගම ඇවර කිරීම සඳහා අධ්‍යක්‍ෂක මණ්ඩලය විසින් තීරණය කර තිබුණ ද, 2022 අප්‍රේල් 30 දින දක්වාම ඇවරකරුවෙකු පත්කර නොතිබුණි. | එකඟ වේ. | සමාගම ඇවර කිරීමට තීරණය කර ඇති බැවින් එය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට වගකිව යුතු නිලධාරීන් ක්‍රියාකල යුතු බව . |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල (රු) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| හැටන් නැෂනල් බැංකුණය ශේෂය | 4,997,452,058 | ශේෂ සනාථන ලිපි | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සඳහා ශේෂ තහවුරු කිරීම් ඉල්ලුම් කර ලබා ගත යුතු බව. |
| රජයෙන් ලැබිය යුතු ශේෂය | 17,782,563 | ශේෂ සනාථන ලිපි | එකඟ වේ මේ පිළිබඳව ඉදිරියේ දී කටයුතු කරනු ඇත | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සඳහා ශේෂ තහවුරු කිරීම් ඉල්ලුම් කර ලබා ගත යුතු බව. |
| නැව්තෙල් රක්ෂණය වෙනුවෙන් ලැබිය යුතු ශේෂය | 28,040,453 | මූලාශ්‍ර ලේඛන, ශේෂ සනාථන ලිපි, වයස් විශ්ලේෂණ වාර්තා සහ උපකාරක ලියවිලි | එකඟ වේ මේ පිළිබඳව ඉදිරියේ දී කටයුතු කරනු ඇත. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සඳහා ශේෂ තහවුරු කිරීම් ඉල්ලුම් කර ලබා ගත යුතු බව සහ අනෙකුත් අදාල සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. |
| වෙළඳ ණයගැතියන්ගෙන් ලැබිය යුතු ශේෂය | 3,589,879 | මූලාශ්‍ර ලේඛන සහ උපකාරක ලියවිලි | එකඟ වේ මේ පිළිබඳව ඉදිරියේ දී කටයුතු කරනු ඇත. | අදාල විගණන සාක්ෂි ඉදිරිපත් කිරීමට කළමනාකරණය කටයුතුකල යුතු බව. |
| ගෙවිය යුතු අනිකුත් දෑ වලට අදාළ ශේෂය | 7,373,613 | මූලාශ්‍ර ලේඛන සහ උපකාරක ලියවිලි | එකඟ වේ මේ පිළිබඳව ඉදිරියේ දී කටයුතු කරනු ඇත. | අදාල විගණන සාක්ෂි ඉදිරිපත් කිරීමට කළමනාකරණය කටයුතුකල යුතු බව. |
| බැංකු මුදලින් ගෙවීම් | 34,518,489 | ගෙවීම් වවුචර්පත් සහ උපකාරක ලියවිලි | එකඟ වේ මේ පිළිබඳව ඉදිරියේ දී කටයුතු කරනු ඇත | ගෙවීම් වවුචර් විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතුකල යුතු බව. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනට මව් සමාගම වන ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ලැබිය යුතු ශේෂය ලෙස රු.103,666,952 ක් දැක් වුව ද ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ලද ශේෂ සනාථන ලිපිය අනුව එදිනට සමාගමට ගෙවිය යුතු ශේෂය රු.73,218,272 ක් විය. ඒ අනුව සමාගමට ලැබිය යුතු ශේෂයේ රු.30,448,680 ක වෙනසක් නිරීක්‍ෂණය විය. මෙම වෙනස්කම සඳහා හේතු වූ කරුණු පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමග සාකච්ඡා කර එකඟතාවයකට පැමිණ නොතිබුණි. තවද, ඉහත ශේෂය තුල අන්තර්ගත 2017 වර්ෂයේ සිට ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් අයකරගත යුතු වූ ටග් යාත්‍රා සඳහා වන්දි මුදල් රු.25,719,981 ක්, කළමනාකරණ සේවා ගාස්තු රු.76,547,855 ක් හා සමාගම් පරිශ්‍රයේ පිහිටි ඉන්ධන පිරවුම්හලෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් වාහන සඳහා නිකුත් කර තිබූ ඩීසල් හා පෙට්‍රල් ලීටර් 11,449 ක් සඳහා වූ රු.1,399,116 ක් වූ ශේෂ 2022 මාර්තු 31 දින දක්වාම සමාගම වෙත ලැබී නොතිබුණි. | 2021 වර්ෂයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ලද ශේෂ සනාථන ලිපිය අනුව සමාගමට ගෙවිය යුතු ශේෂය රු.73,218,272 ක් ලෙස සඳහන් වුවද 2020 වර්ෂයේ දී ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අප සමාගම වෙත ලබා දිය යුතු බවට රු.98,938,252 ක ශේෂ සනාථන ලිපියක් එවා ඇත. මෙම හිඟ මුදල අයකර ගැනීම සඳහා සිහි කැඳවීම් කීප වරක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත යැවුවද එම මුදල් ලැබී නොමැත. | විසිරුවා හැරීමට තිරණය කර ඇති බැවින් නියමිත වගකීම් පියවීම සඳහා හිඟ ශේෂ ලබා ගැනීමට කළමනාකරණය කටයුතු කල යුතු බව. |
| (ආ) | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාගමෙන් අධිකාරියට ලැබිය යුතු මුදල් ලෙස රු.5,800,921 ක් දක්වා තිබුණි. කෙසේ වුවද, සමාගමේ 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ඉහත මුදල ගෙවිය යුතු මුදලක් ලෙස දක්වා නොතිබුණි. ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ලබාගන්නා ලද තොරතුරු අනුව අධිකාරියට ලැබිය යුතු කළමනාකරණ ගාස්තු හා සමාගමේ විවිධ බිල්පත් පියවීම වෙනුවෙන් ඉහත මුදල අධිකාරියට ලැබිය යුතුව පැවතුණි. | රු.5,800,921 ක ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ගෙවිය යුතු මුදලක් මාගම්පුර වරාය කළමනාකරණ (පුද්) සමාගමේ ගිණුම් වල සඳහන් වී නොමැත. | ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමග සාකච්ඡා කොට අදාළ මුදල ගෙවිය යුතු ශේෂයක් නම් එය සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කිරීමට කටයුතු කිරීම කළමනාකරණයේ වගකීම බව. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගම විසින් 2014 වර්ෂයේදී නැව් තෙල් මිලදී ගැනීම සඳහා දේශීය පෞද්ගලික බැංකුවකින් ලබා ගෙන තිබූ රු.3,144,178,059 කට සමාන එක්සත් ජනපද ඩොලර් 24,002,438 ක ණය මුදලට අදාලව සමාගම විසින් 2017 වර්ෂයේදී සහ එයින් පසු වර්ෂවලදී ණය වාරික මුදල් හෝ පොළී මුදල් කිසිවක් ගෙවා නොතිබුණි. සමාගමේ මූල්‍ය ප්‍රකාශ අනුව සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු වූ රු.179,325,034 ක් වූ පොළී මුදල ද ඇතුලත්ව 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ අනුව ගෙවිය යුතු ණය පොළී මුදල (Interest) රු.1,223,952,222 ක් වී තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු ණය හා පොළී ශේෂය රු.4,997,452,058 කට සමාන එ.ජ.ඩො. 24,933,180 ක් වී තිබුණි. මෙම ශේෂය සම්බන්ධයෙන් සමාගම විසින් 2021 දෙසැම්බර් 31 දින ශේෂ සනාථන කැඳවා තිබුණ ද අදාල බැංකුව විසින් ශේෂ සනාථන ලබා දී නොතිබුණි. ඒ හේතුවෙන් ඉහත සඳහන් ගෙවිය යුතු ණය ශේෂයෙහි නිරවද්‍යතාවය පිළිබඳව අවිනිශ්චිතතාවයක් පැවතුණි. තවද මෙම ණය මුදල ආපසු අයකර ගැනීම සඳහා අදාළ බැංකුව විසින් 2020 වර්ෂයේ සමාගමට විරුද්ධව නඩුවක් ගොනුකර පවත්වාගෙන යන නමුත් ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | එකඟ වේ.<br>ගෙවිය යුතු ණය ශේෂයෙහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ශේෂ සනාථන ලිපි අදාල බැංකුව වෙත යැවූ නමුත් නඩු කටයුත්තක් පවතින බැවින් බැංකුව විසින් එම ශේෂ සනාථන ලිපි සඳහා පිළිතුරු ලබා දීම අත් හිටුවා ඇත. එබැවින් එම ණය ශේෂය පිළිබඳ නිරිවද්‍යතාව තහවුරු කර ගැනීම අපහසු වී ඇත. සමාගමට විරුද්ධව පවරා ඇති නඩුව පිළිබඳව හෙළිදරව් කිරීම 2022 වර්ෂයේ ගිණුම් සැදීමේදි නිවැරදි කරනු ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව අදාල නඩු කටයුත්ත පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කල යුතු බව. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 2015 ජූනි 17 දිනැති අංක පීඊඩී 3/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 2.2 වගන්තිය | චක්‍රලේඛයට අනුව සමාගම එෆ් (F) වර්ගීකරණයට ඇතුළත්වන බැවින් සමාගමේ පාලක මණ්ඩල රැස්වීම් දීමනා ගෙවීම සඳහා නිර්දේශය හා එකඟතාවය ලබා ගත යුතු වේ. තවද, චක්‍රලේඛය අනුව එහි සඳහන් ඒ (A) සිට ඊ (E) දක්වා වූ | 2020 ජනවාරි 13 නිකුත් කරන ලද ජනාධිපති චක්‍රලේඛ අංක 02/2020 ට අනුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වෙත රු.25000.00 ක මුදලක් | විධිමත් අනුමැතියකින් තොරව ගෙවන ලද මුදල් අය කර ගැනීමට කටයුතු කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | වර්ගීකරණය අනුව වැඩිම රැස්වීම් දීමනාව වූ රු.12,500 ක් ඒ (A) ශ්‍රේණියේ රජය සතු ව්‍යාපාර සඳහා ගෙවනු ලබයි. එසේ තිබියදී, මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක නොකරන එෆ් (F) වර්ගයේ රාජ්‍ය ව්‍යවසායක් වූ සමාගම 2021 වර්ෂයේදී පවත්වන ලද රැස්වීම් 03 ක් සඳහා සහභාගී වූ එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත පැමිණීමේ දීමනාව රු.25,000 ක් බැගින් රු. 425,000 ක් ද, 2020, 2019 සහ 2018 වර්ෂ තුළ දී රැස්වීම් 19 ක් පැවැත්වීම වෙනුවෙන් රු.2,350,000 ක් චක්‍රලේඛයට පටහැනිව ගෙවා තිබුණි. තවද, ඈවර කිරීමට නියමිත වූ සමාගම වෙනුවෙන් වැයකරන ලද මෙම වියදම්වල ආර්ථිකභාවය මතභේදයට තුඩුදෙන බව නිරීක්ෂණය විය. | මාසිකව ලබා දීමට අනුමැතිය ලබා දී ඇත. මීට පෙර වසර වලදී ද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව මෙම දීමනා ගෙවා ඇත. | |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.8 වගන්තිය | සමාගම් ලේකම් විසින් අධ්‍යක්ෂක මණ්ඩල තීරණවල ප්‍රගතිය සොයාබලා අධ්‍යක්ෂක මණ්ඩලය වෙත වාර්තා කලයුතු වුවත් සමාගම විසින් වර්ෂය තුළදී එසේ සිදුකර ඇති බව විගණනයේදී අනාවරණය නොවුණි. 2022 ජනවාරි 27 දිනැති අංක PAS/A/MPMC/2021/INF/02 දරන විගණනය සඳහා තොරතුරු ඉල්ලීමේ ලිපිය මගින් අධ්‍යක්ෂක මණ්ඩල තීරණවල ප්‍රගතිය ඉල්ලා සිටියද 2022 මාර්තු 31 දින තෙක් අදාල තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. | එකඟ වේ. සමාගම් ලේකම්තුමිය වෙත මෙම ලිපිය යොමු කර ඇති අතර එම තොරතුරු සැපයීම එම නිලධාරිනියගේ කාර්යයකි. | අධ්‍යක්ෂක මණ්ඩලය වෙත වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු බව. |

## 1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ අනුව ලැබිය යුතු රඳවා ගැනීමේ බදු ශේෂය රු.5,474,493 ක් වූ නමුත් එයින් රු.2,124,954 කට අදාල බදු සහතිකපත් විගණනයට ඉදිරිපත් නොවුණි. තවද, බදු සහතිකපත් නොවීම හේතුවෙන් ඉහත ලැබිය යුතු ශේෂය උපලබ්ධිවීම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය. | ආයතනය ගණන් බේරා වසා දැමීමට අවශ්‍ය කටයුතු මේ වන විට සම්පාදනය කරමින් පවතී, එහිදී සමාගම විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් නිශ්කාශණයක් (Clearance) ලබා ගත යුතුව ඇත. මෙම කටයුතු සඳහා සමාගමේ 2015 සිට 2016 දක්වා බදු උපදේශකයන් වශයෙන් කටයුතු කල සමාගම සමඟ එකඟතාවයකට පැමිණ රජයට ගෙවිය යුතු බදු ආදිය පියවා අදාල සහතිකපත් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | අදාළ මූලික සාක්ෂි ලිපි ලේඛණ ඉදිරිපත් කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡාකර අවසාන විසඳුමකට පැමිණිය යුතු බව. |

| | | |
|---|---|---|
| (ආ) ව්‍යවස්ථාපිත ගෙවීම් අදාළ කාල පරිච්ඡේදයන් තුළදී නිරවුල් කළ යුතු වුවද, 2017 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.2,381,117 ක් වූ ගෙවිය යුතු ආදායම් බදු ශේෂය, එකතු කල අගය මත ගෙවිය යුතු බදු ශේෂය රු.914,683, සේවක අර්ථසාධක සහ භාරකාර අරමුදලට දායක මුදල් ලෙස ගෙවිය යුතු රු.223,032 ක් නිරවුල් කිරීමට සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි. | බදු සම්බන්ධව ඉහත 1.8 (අ) හි සඳහන් කල පිළිතුර අදාල වේ.<br>සේවක අර්ථ සාධක සහ භාරකාර අරමුදල් වලට ගෙවිය යුතු මුදල් සම්බන්ධව ගණනය කිරීමක් සිදු කර එය පියවීමට කටයුතු කරනු ලැබේ. | ආදායම් බදු ශේෂය හා අනෙකුත් ශේෂ නිරවුල් කිරීමට කළමනාකරණය විසින් ක්‍රියාකල යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.441,980,579 ක පාඩුවක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පාඩුව රු.246,874,417 ක් විය. ඒ අනුව පාඩුව රු.195,106,162 කින් වැඩිවී තිබූ බව නිරීක්ෂණය විය. මෙලෙස තවදුරටත් පාඩුවක් පැවතීමට ශ්‍රී ලංකා රජය මඟින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් මත මාගම්පුර වරාය කළමනාකරණ පුද්ගලික සමාගමේ මෙහෙයුම් කටයුතු 2017 නොවැම්බර් 13 දින අවසන් කර තිබීම හේතුවෙන් මෙහෙයුම් ආදායම් නොමැතිවීම, ණය මත පොළිය සහ විදේශ විනිමය පරිවර්ථන අලාභය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| | 2021<br>(රු) | 2020<br>(රු) |
|---|---|---|
| ආදායම | - | - |
| ඍජු වියදම් | - | - |
| පරිපාලන වියදම් | (9,202,863) | (10,664,971) |
| මෙහෙයුම් ලාභය/(අලාභය) | (9,202,863) | (10,664,971) |
| ශුද්ධ මූල්‍ය පිරිවැය | (143,947,702) | (142,218,752) |
| විදේශ විනිමය ලාභය/(අලාභය) | (288,830,015) | (93,990,694) |
| බදු පෙර ශුද්ධ ලාභය | (441,980,579) | (246,874,417) |
| ආදායම් බදු | - | - |
| බදු පසු ශුද්ධ ලාභය | (441,980,579) | (246,874,417) |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. සමාගමේ මෙහෙයුම් කටයුතු 2017 නොවැම්බර් 13 දින අවසන් කර තිබීම හේතුවෙන් 2020 හා 2021 වර්ෂයන් තුල මෙහෙයුම් කටයුතු වලින් සමාගමට ආදායම් ලැබී නොතිබුණි.

ii. 2020 වර්ෂයේදී රු.93,990,694 ක් වූ විදේශ විනිමය අලාභය සමාලෝචිත වර්ෂයේදී රු.288,830,015 ක් දක්වා සියයට 207 කින් වැඩි වී තිබුණි.

iii. 2020 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සේවක වැටුප් හා දීමනා වියදම රු.1,950,000 සිට රු.4,849,656 ක් දක්වා සියයට 149 කින් වැඩිවී තිබුණි. මාසික ප්‍රවාහන දීමනාව ඇතුලත් සභාපති දීමනාව හා කළමනාකරණ අධ්‍යක්ෂ දීමනාව රු. 290,000 ක් බැගින් හා තවත් නිලධාරීන් දෙදෙනෙකු සඳහා මාසිකව රු.100,000 ක් බැගින් 2021 වර්ෂයේ ගෙවා තිබීම හා 2020 වර්ෂයේදී ඉහත දීමනා සභාපති හා කළමනාකරණ අධ්‍යක්ෂ වෙත මාස 05 ක් සඳහා ද අනිකුත් නිලධාරීන් වෙත මාස 04 ක් සඳහා ද ගෙවා තිබීම ඉහත වැඩිවීම සඳහා හේතුවී තිබුණි.

**2.3. අනුපාත විශ්ලේෂණය**

| | 2021 | 2020 |
|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 1:3.40 | 1:3.40 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 1:3.63 | 1:3.43 |

2020 වර්ෂයේ ජංගම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 1:3.40 සහ 1:3.43 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එය පිළිවෙලින් 1:3.40 ක් සහ 1:3.63 ක් වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 මැයි 18 දිනැති අංක MPS/2021/01/11 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගමේ මෙහෙයුම් කටයුතු අවසන් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා තිබුණි. 2021 මැයි 18 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල සාකච්ඡාවේදී එම අනුමැතිය ලබා දී තිබුණු අතර එම කැබිනට් පත්‍රිකාව සඳහා ජල සම්පාදන අමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ සැලකිල්ලට ගෙන ඒ අනුව පියවර ගන්නා ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරියට උපදෙස් ලබාදෙන ලෙස වරාය හා නාවික අමාත්‍යාංශයේ ලේකම්වරයාට දන්වා තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත 2021 ජූලි 29 දින ඇමතිවරයා විසින් ඉදිරිපත් කරන ලද ගැටලු සඳහා පැහැදිලි කිරීම් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත සමාගමේ සභාපතිවරයා විසින් ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සමාගම වෙත කිසිදු උපදෙසක් ලබා දී නොතිබුණි. | එකඟ වේ. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඉල්ලන ලද සියළු තොරතුරු සමාගම විසින් නිසිලෙස ලබා දී ඇති බැවින් ඉදිරි කටයුතු පිළිබඳ දැනුවත් කිරීම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වගකීමකි. | අමාත්‍ය මණ්ඩල තීරණයේ නිර්දේශ පරිදි කටයුතු කල යුතු බව. |

| | | |
|---|---|---|
| (ආ) සමාගමේ කටයුතු අවසන් කිරීම සඳහා 2021 මැයි 18 දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය ලබා දී තිබූ නමුත් මේ සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ හා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට 2021 නොවැම්බර් 16 දක්වා මාස 6 ක පමණ කාලයක් ගත කර තිබුණි. ඒ අනුව 2021 නොවැම්බර් 16 දින නිකුත් කරන ලද අංක 01/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තු චක්‍රලේඛය පරිදි අමාත්‍ය මණ්ඩල තීරණය ගෙන මාස 6 ක් ඇතුලත විසුරුවා හැරීම සිදු කල නොහැකි වීම නිසා අවශ්‍ය කාලය දීර්ඝ කර ගැනීමට නැවත අමාත්‍ය මණ්ඩල තීරණයක් ගැනීමට මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුව විසින් 2022 ජනවාරි 5 දින උපදෙස් ලබා දී තිබූ නමුත් 2022 අප්‍රේල් 25 දින දක්වාම එබඳු කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ වේ. මේ පිළිබඳව වරාය හා නාවික අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් මස කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. | භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවේ උපදෙස් ප්‍රකාරව නැවත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් කඩිනමින් ඉදිරිපත් කල යුතු බව. |

### 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේදී සමාගමේ සේවකයන් වන්දි ගෙවා ඉවත් කිරීමේදී ඇති වූ ආරවුල් සහගත තත්ත්වය කොළඹ කාර්මික අධිකරණයේ, කාර්මික බේරුම්කරණ අංක A/37/2017 දරන තීරණය සහ 2018 පෙබරවාරි 02 දින පාර්ශවකරුවන් අතර ඇති කර ගන්නා ලද සමථ කොන්දේසිවලට එකඟ වීම මත අවසන් කර තිබුණි. සමථ ගිවිසුමේ කොන්දේසි අංක 18 (ආ) අනුව 2017 නොවැම්බර් මාසය සඳහා හිඟ අතිකාල දීමනා සහ/හෝ 2018 ජනවාරි දක්වා හිඟ වැටුප් ගෙවිය යුතුව ඇත්නම්, එම ගෙවීම් 2018 පෙබරවාරි 28 වන දිනට පෙර ගෙවා නිම කළ යුතු බවට එකඟ වී තිබුණි. සමාගම විසින් එම එකග වූ කොන්දේසිවලට පටහැනිව සමාගමේ මෙහෙයුම් අක්‍රියව පැවති 2017 දෙසැම්බර් සහ 2018 ජනවාරි මාසයන්ට අදාලව ගමන් වියදම්, නවාතැන් දීමනා, කාර්යසාධන දීමනා හා වාහන දීමනා ලෙස රු.12,211,073 ක් වූ වෙනත් දීමනාවන් සේවකයන් වෙත ගෙවා තිබුණි. මේ පිළිබඳව 2017, 2018, 2019 සහ 2020 වර්ෂවල විගණන | 2017 විගණකාධිපති වාර්ථාව සඳහා පිළිතුරු ලෙස 2018 නොවැම්බර් 12 දතමින් එවකට සභාපතිවරයා විසින් මේ පිළිබඳව කරුණු ඉදිරිපත් කර ඇත, ඒ අනුව ඔහු විසින් සිදු කර ඇති පැහැදිලි කිරීම අනුව මෙම සේවකයන් එවකට සමාගමේ ඉහල කළමණාකාරීත්වයේ කටයුතු කල අය වේ. ඔවුන්ගේ සේවය 2018.01.31 අවසන් වුවද නැවත අධ්‍යක්ෂක මණ්ඩල තීරණයක් හරහා සමාගමේ ඉතිරි වූ වැඩකටයුතු ආදිය, උදා : සමථ කොන්දේසි ආයතනය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම, ඈවර කරන තෙක් මූල්‍ය වාර්ථා පවත්වාගෙන යාම, වත්කම් පැවරීමේ කටයුතු, තෙල් ටැංකි සංකීර්ණය හිස් කර පැවරීම, සමාගමේ නඩු කටයුතු සඳහා සම්බන්ධ වීම, අල්ලස් හෝ දූෂණ කොමිසම/මූල්‍ය අපරාධ විමර්ශණ කොට්ඨාශය ආදීන්ගේ විමර්ශණ වලට සහයෝගය දැක්වීම ආදිය සඳහා මෙම සේවකයන් ඔවුන්ගේ මාසික වැටුප ගෙවා ආයතනය තුල රඳවා තබාගෙන ඇත. | වන්දි මුදල් ගෙවීමේදී සමථ කොන්දේසි අනුව කටයුතු කල යුතුය. එම කොන්දේසිවලට පටහැනිව යම් ගෙවීමක් සිදු කර ඇත්නම් අදාල ගෙවීම්වලට වගකිවයුතු නිලධාරීන්ගෙන් ඒවා ආපසු අය කර ගැනිමට කළමනාකරණය ක්‍රියාකල යුතුය. |

| | | |
|---|---|---|
| වාර්තා මගින් ද පෙන්වා දී තිබු නමුත් අදාල කරුණ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර වැඩිපුර ගෙවීම් සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අයකර ගැනීම සඳහා කළමනාකරණය සහ වගකිවයුතු පාර්ශවයන් විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ආ) ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් තුල ගෙවීම් වවුචර් සියල්ල අනුක්‍රමික අංක අනුව පිළියෙල කොට ආරක්ෂා සහිතව තබා ගත යුතුය. එසේම සියළුම වවුචර් විගණනය සඳහා සම්පූර්ණ කර සුදානම් කර තැබීමට වවුචර් භාර නිලධාරියා වගබලා ගත යුතු වුවද, මාගම්පුර වරාය කළමනාකරණ සමාගම විසින් 2017 සහ 2018 වර්ෂවලදී ගෙවීම් කරන ලද පිළිවෙලින් රු.29,975,094 කට රු. 4,543,395 ක අදාළ ගෙවීම් වවුචර් 123 ක් 2022 මැයි 15 දින දක්වාම විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | 2017 වර්ෂයේ අස්ථාන ගත වී ඇති වව්චර වලින් සිදු කරන ලද ගෙවීම් තහවුරු කිරීම සඳහා එම චෙක් පත් නිකුත් කර ඇත්තේ කා හටද යන්න තහවුරු කර ගැනීම සඳහා චෙක් පත් වල පිටපත් සහ අදාල අනෙකුත් වාර්ථා ආදිය ඉදිරිපත් කර ඇත. 2018 වර්ෂයේ ගෙවීම් සඳහා එම චෙක්පත් සහ අදාල වාර්ථා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | සමාගමේ ලිපි ලේඛණ හා වත්කම් වරාය අධිකාරිය වෙත ගෙනඒමේදී එම කටයුතු විධිමත්ව හා ක්‍රමානුකූලව සිදු කර නොමැති හෙයින් ඒ පිළිබඳ වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගත යුතුය.<br><br>එසේම මෙම කටයුතු විධිමත්ව හා සැලකිලිමත්ව සිදු කිරීමට අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබාදීම මව් සමාගමේ හා රේඛීය අමාත්‍යාංශයේද වගකීම වේ. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අරමුණු අනුව ප්‍රසම්පාදනයකදී වඩාත් යහපත් වූ විනිවිදභාවයක් හා මනා පරිපාලනයක් පැවතීම තහවුරු කිරීමට සමාගම වගබලා ගත යුතු වුවත්, සමාගම විසින් 2020 වර්ෂයේදී ආයතනයේ නීතිමය කටයුතු සඳහා පෙනී සිටින නීතිඥ සමාගමකට රු.7,250,000 ක මුදලක් සහ 2021 වර්ෂයේදී නීතිඥ සමාගම් වලට රු.3,005,000 ක් නීති වියදම් ලෙස ගෙවා තිබුණ ද, එම නීතිඥයන් තෝරා ගැනීමේදී විනිවිදභාවයකින් හා මනා පරිපාලනයකින් යුක්ත ක්‍රමවේදයක් අනුගමනය කරන ලද බවට තොරතුරු හා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. එසේම අදාළ නීති උපදේශක සමාගම සමඟ එළඹෙන ලද ගිවිසුම් ද විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. | ආයතනයේ නීතිමය කටයුතු සඳහා පෙනී සිටි නීතිඥයින්ට කරන වියදම අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත ගෙවා ඇත .නව අධ්‍යක්‍ෂක මණ්ඩලය 2021 ජුලි මස අග භාගයේදී පත්වන ලදී. ඒ අවස්ථාවේ දී කොළඹ දිසා අධිකරණයේ පනවා ඇති DDR 1347/19 දරණ නඩුව සම්බන්ධයෙන් අධ්‍යක්‍ෂක මණ්ඩල රැස්වීම වෙත ඉදිරිපත් කරන ලදී . එම අවස්ථාවේදී එම නඩු වර්ගය (DDR නඩුවක් වශයෙන්) යොමු කර ඇති බවත්, ඉදිරි කැඳවීමේ දිනය ලෙස 2020.08.18 දින අධිකරණයේ කැඳවීමට නියම කර තිබුණි.<br><br>මෙම නඩු වල විශේෂත්වය වන්නේ නඩුව කැඳවන ප්‍රථම දිනයේදීම | ප්‍රසම්පාදන කටයුතු වලදී විනිවිදභාවයකින් හා මනා පරිපාලනයකින් යුක්ත ක්‍රමවේදයක් අනුගමනය කිරීම කළමනාකරණයේ වගකීම වේ. |

විරෝධතා ගොනු කලයුතු බවයි.

එසේ නොවුන හොත් ගරු අධිකරණය විසින් නඩුවේ ඉල්ලා ඇති බිලියන 4.4 මුදල සඳහා නෙසායි තීන්දු ප්‍රකාශය නියම කලහොත් සමාගම බරපතල අර්බුදයකට පත් වේ. මන්ද ඒ වන විටත් සමාගම සතුව තිබූ මුදල බිලියන 1.2 කට ආසන්න මුදලක් නිසාවෙනි. ඒ අනුව හැකි ඉක්මනින් ගරු අධිකරණය එකී විරෝධතා ගොනු කිරීමට අවශ්‍ය වූ නිසා ඒ සඳහා කාලයක් නොතිබූ බැවින් විශ්වාසවන්ත සහ හැකි ඉක්මනින් විරෝධතා සකස්කිරීම සඳහා නීතිඥ උපදෙස් ලබා ගැනීම ප්‍රධාන අවශ්‍යතාවක් වූ බැවින් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියට යටත්ව ඉහත නීතිඥවරුන්ගේ සහය ලබා ගන්නා ලදී. එහිදී නීතිඥවරුන් සඳහා නීතිඥ ගාස්තු මුදලින් ගෙවා ඇත්තේ සම්පූර්ණ නඩු කටයුත්ත සඳහා වේ. නැවත කිසිදු ගෙවීමක් මේ සඳහා සිදු නොකෙරේ.

2021 වර්ෂයේ ගෙවන ලද රු.3,005,005 ආයතනය විසුරුවා හැරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට පත් කරන ලද නීතිඥයින් හට ගෙවන ලද නීතිඥ ගාස්තු වේ. එයද අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව තෝරා ගන්නා ලදී.